**පිවිතුරු සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රවේශය සඳහා කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීමේ ව්‍යාපෘති -2015**

---

පිවිතුරු සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රවේශයන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව 2011 අගෝස්තු 29 දින ඇතුලත් වූ අංක 9158 දරන ප්‍රදාන ගිවිසුමේ 11 (ඒ) හා (බී) වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

ව්‍යාපෘති ගිවිසුම් ලියවිල්ල අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලංකා විදුලි බල මණ්ඩලය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ජනතාව සඳහා පිවිතුරු බලශක්ති ප්‍රවේශයන් වැඩි කිරීම සහ ලංකා විදුලි බල මණ්ඩලයේ පුහුණු හැකියා හා සේවා සැපයීම වැඩි දියුණු කිරීම වේ.

ව්‍යාපෘති ප්‍රදාන ක්‍රියාත්මක කිරීමේ අත්පොතේ (VII) 33 වගන්තිය අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 142 කට සමාන ඇ.එ.ජ. ඩොලර් 1.08 ක් වන අතර ඉන් ඇ.එ.ජ. ඩොලර් 873,975 ක් මූල්‍යයනය කිරීමට ජපන් ෆන්ඩ් ෆෝ පවර්ටි රිඩක්ෂන් (Japan Fund For Poverty Reduction) **(**JFPR**)** එකඟ වී තිබුණි. තවද, ඇ.එ.ජ.ඩොලර් 211,200 ඊටීසී පවුන්ඩේෂන් මූල්‍යයනය කරනු ලබයි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 නොවැම්බර් 08 දින ආරම්භ ලද අතර 2014 නොවැම්බර් 08 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව අවසාන දිනය 2017 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා

පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌණ පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව

(ඉ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව

(ඊ) ණය සහ ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(උ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඔ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්වාගණනය කරන ලද විගණන මතය සඳහා පදනම**

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 පරිච්ඡේදයේ විස්තර කර ඇති කරුණු මත මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 මතය**

--------

මේ දක්වා මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 පරිච්ඡේදයේ පෙන්වා දී ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණුකොට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌණ පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව

(ඈ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

මුදල් හා සැලසුම් අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 දරන චක්‍රලේඛය අනුව ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2017 අගෝස්තු 22 දින ඉදිරිපත් කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ලංකා විදුලිබල මණ්ඩලය අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව, ප්‍රාග්ධන ස්වරූපයේ කාර්යයන් සඳහා වන කම්කරු, ද්‍රව්‍ය සහ පොදු කාර්ය පිරිවැය ආදිය සම්මත පිරිවැය ක්‍රමය (Standard Cost Method) යටතේ තීරණය කරනු ලැබේ. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දේපල, පිරියත, උපකරණ හා කරගෙන යන වැඩවල ඇතුලත් ව්‍යාපෘතියේ සේවා සම්බන්ධතා ගාස්තු සත්‍ය පිරිවැය මත තීරණය කර තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

අරමුදල් ප්‍රදානය කරන ලද නියෝජිතායතනයෙන් අයකර ගැනීම අරමුණු කරගෙන ලංකා විදුලි බල මණ්ඩලය විසින් සේවා සම්බන්ධතා වෙනුවෙන් දරන ලද රු.මිලියන 41.05 ක පිරිවැය යෝග්‍ය නොවන ආකාරයෙන් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ලංකා විදුලි බල මණ්ඩලය විසින් දරන ලද ප්‍රාග්ධනය යටතේ දක්වා තිබුණි.

### 2.2.4 සැසඳුම් නොකල ශේෂ

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සනාථ කර තිබූ 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව පවත්වාගෙන යන ලද අග්‍රිම අරමුදල් ගිණුමේ ශේෂය වූ රු.මිලියන 15.21 ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අදාල ශේෂය වූ රු.මිලියන 15.47 සමඟ සමාන නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුල හා 2015 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජන සම්බන්ධයෙන්වන වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම් අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ ඇතුලත් ප්‍රතිපාදන | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | ඇඑජ ඩොලර් | රු. මිලියන | රු. මිලියන | ඇඑජ ඩොලර් | රු. මිලියන | ඇඑජ ඩොලර් | රු. මිලියන |
| ඒඩීබී | 1.08 | 142 | 29 | 0.32 | 45.39 | 0.58 | 83.76 |
| එකතුව | 1.08 | 142 | 29 | 0.32 | 45.39 | 0.58 | 83.76 |

## 3.2 මෙහෙයුම් ප්‍රගතිය

--------------------

ලද තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා සමස්ත සැලසුමක් සකස් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ලඟාකර ගත යුතු වාර්ෂික ඉලක්ක තීරණය කර නොතිබුණි. කෙසේ වුවද, 2015 දෙසැම්බර් 31 දිනට නිවාස 1,676 කට සේවා සම්බන්ධතා ලබා දී තිබුණි. තවද, එදිනට නිවාස 1,103 කට සේවා සම්බන්ධතා ලබාදීම සඳහා වන කාර්යයන් සිදුකරමින් තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව 2015 දෙසැම්බර් 31 දිනට සේවා සම්බන්ධතා නිවාස 3,630 ලබාදී තිබූ බව දක්වා තිබුණි.

## 3.3 මූල්‍ය පාලනය

-----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රදාන ක්‍රියාත්මක කිරීමේ අත්පොතේ ඇමුණුම් 04 හි සී (10) කොටසේ අවශ්‍යතාවය පරිදි සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ කාර්යයන් ලංකා විදුලි බල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයට යටත් කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 626 පරිදි, සීම ව්‍යාපාරයකම මූල්‍ය ප්‍රකාශන අදාල ව්‍යාපෘතිය මගින් පවත්වාගෙන යනු ලබන වෙනම ගිණුම්කරණ වාර්තා පදනම් කරගෙන පිළියෙල කල යුතුව ඇත. කෙසේ වුවද, ඉහත සඳහන් අවශ්‍යතාවයට පටහැනිව ලංකා විදුලි බල මණ්ඩලය ව්‍යාපෘතියේ ලැබීම් හා ගෙවීම් සටහන් කිරීම සඳහා වෙනම ලෙජර ගිණුම් කාණ්ඩයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ලංකා විදුලි බල මණ්ඩලයේ පොදු ලෙජරයෙන් උපුටාගත් දත්ත පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.